


# ආසියාවේ ළමයින් මරන අපිරිසිදු වාතය

**බැංකොක්හි පිහිටි රමානිබොඩි ආරෝග්‍යශාලාවේ දෙවන මහලයේ පිහිටි ළමාරෝග චිකිත්සාගාරය ළමුන්ගෙන් හා දෙමව්පියන්ගෙන් ද සුදුපැහැති හිස්වැසුම් පැළඳගත් සාත්තු සේවිකාවන්ගෙන් ද පිරි කලබලකාරී ස්ථානයකි. එහි ඇතිවන සිනහවන් සහ හඬා වැලපීම් හඬ පරිගණක යන්ත්‍රවල සහ දුරකථන නාදවීම්වලින් යටපත් වී ඇත. ළමයි බොහෝ දෙනෙක් කිවිසුම් හරිමින් කහිමින් සහ හති දමමින් සිටිති.**

පැරේ වත්‍රරේඩි නමැති එක් දැරියක් දෙස්තර සුවට් බෙන්ජපොන්පිටක් ගේ කාමරයේ භයෙන් සහ සැකයෙන් වාඩිවී සිටින්නීය. දොස්තර මහතා වෙද තලාව ඇගේ පපුවමත තබා අප්‍රසන්නතාවක් දක්වයි. "වාතයේ අපිරිසිදු භාවය ඔබතුමාට වැටහෙනවා ඇති. ක්‍රීඩා කිරීමේ දී ඇය මහත්සේ කරදර වෙනවා. බොහොම ඉක්මනින් ඇයට හුස්ම ගැනීම අපහසු වෙනවා. ඇගේ වයස අවුරුදු 16 යි. නමුත් මහලු ස්ත්‍රියක් වගේ" යනුවෙන් කඳුලෙන් දැස පුරවාගත් ඇගේ මව කීවාය.

පැරේ සහ ඇගේ මව කාමරයෙන් පිටව ගිය පසු දෙස්තර බෙන්ජපොන්පිටැක්ගේ මුහුණ දුක්මුසු වී තිබුනි.

"මෙය ජීවිත භයගන්වන දිගුකාලීන තත්ත්වයක්. ඒ තරුණ ස්ත්‍රිය ඇගේ පරිසරයේම ගොදුරක් වී සිටිනවා. පසුගිය දශ අවුරුදු කාලය තුළ මම මේ චිකිත්සක කටයුතුවල යෙදී ඉන්නවා. මම පටන්ගත් කාලයට වඩා තුන්හතර ගුණයකින් ඇදුම සහ ශ්වසන රෝගයන්ගෙන් පෙළෙන ළමුන් ඉන්නවා. ඔවුන්ගෙන් වැඩිදෙනෙක් වැඩිහිටියන් වනවිට දුර්වල පෙනහලු ක්‍රියාකාරිත්වයෙන් සහ ශ්වසන රෝගවලින් පෙළෙන්නවුන් විය හැකියි. එමෙන්ම අසාධ්‍ය තත්ත්වයේ ළමුන් අඩුවයසෙන් මියැදෙන්නටත් ඉඩ තිබෙනවා" යනුවෙන් රෝගීන් නැවතී සිටි ශාලාව දෙසට අත දිගු කරමින් කීවේය.

බැංකොක් මෙන්ම ආසියාව පුරා භයානක ලෙස ඇතිවන ළමා මරණ වාතය දූෂණය වීමෙන් සිදුවේ. නගරබදව ජීවත්වන පාරේ වැනි ළමුන් ආසියාවේ බොහෝ රටවල සිදුකරන කාර්මිකරණයේ සහ නාගරීකරණයේ ගොදුරු බවට පත්ව ඇත.

රථ වාහනවලින් සහ කර්මාන්ත ශාලාවලින් පිටවන දුම්වලින් අපවිත්‍රවන වාතය ආශ්වාස කිරීම නිසා ඇතිවන විෂවීම ඊට හේතුවේ. එමෙන්ම ආසියාවේ ගම්බද දරුවන්ද එවැනි කරදරවලට පත්නොවන්නේ නොවේ.



ජනගහණය බහුල නගර සහ කුඩා ගම්මානවල සෑම වසරකම ළමුන් දශලක්ෂ ගණනක් මියයන බව හෝ ජීවිත කාලය කෙටිවීමේ රෝග වලට ගොදුරුවීම හෝ සිදුවේ. ආශ්වාස ප්‍රශ්වාස කිරීමෙන් වැළදෙන බෝවෙන රෝග සහ නිව්මෝනියාව වාතය විෂවීමෙන් හටගනු ලැබේ. ආසියාව පුරා ඇති මෙම විශාල කරදරයෙන් මිදෙන්නට නොහැකි බවට සළකුණු ඇත.

එහි නිවෙස්වල ආහාර පිසීමට උපයෝගී කරගන්නා ගින්දරෙන් පිටවන දුමාරයෙන් අවුරුදු පතා ළමුන් මරණයට ගොදුරුවෙති. එවැනි දුම් ඔවුන්ගේ නිවෙස් මර උගුල් බවට පත්කර ඇත.

සංවර්ධනය වන රටවල නිවෙස් තුළ වාතය අපිරිසිදු වීමෙන් වාර්ෂිකව දශලක්ෂ 1.6 ක් පමණ ජීවිත හානි සිදුවේ. පාරිසරික හේතු නිසා ඇතිවන රෝගකාරක ගණනාවක් ඇත. එහෙයින් වාතය අපිරිසිදු වීමෙන් ඇතිවන මරණ සංඛ්‍යාව කොතෙක් දැයි නිවැරදිව ප්‍රකාශ කළ නොහැකිය. එසේ වුවත් ලෝක සෞඛ්‍ය සංවිධානය,පෞද්ගලික සෞඛ්‍ය සංවිධානය, වෛද්‍ය වාර්තා සහ ආරෝග්‍යශාලා නිලධාරීන්ගේ ඒකාබද්ධ වාර්තාවලට අනුව ඉන් මිදිය නොහැකි බවට තීරණය වී තිබේ. ජනගහනය බහුල නගර සහ කුඩා ගම්මානවල සෑම වසරකම ළමුන් දශලක්ෂ ගණනක් මියයන බව හෝ ජීවිත කාලය කොටවීමේ රෝග වලට ගොදුරුවීම හෝ සිදුවේ.ආශ්වාස ප්‍රාශ්වාස කිරීමෙන් වැළදෙන බෝවෙන රෝග සහ නිව්මෝනියාව වාතය විෂවීමෙන් හටගනු ලැබේ. ආසියාව පුරා ඇති මෙම විශාල කරදරයෙන් මිදෙන්නට නොහැකි බවට සළකුණු ඇත.


මැනිලාහි මැකාති වෛද්‍ය මධ්‍යස්ථානයේ ළමාරෝග පිළිබඳ විශේෂඥ වෛද්‍ය මිගුඑල් සෙල්ඩුන් අවුරුදු 45 ක් එහි සේවය කර ඇත්තෙකි. ඔහු ප්‍රකාශ කරන අන්දමට ප්‍රතිකාර ගන්නා ළමුන්ගෙන් සියයට 90 ක් ස්වසන රෝගවලින් පෙළෙන්නෝ වෙති. එපමණක් නොව කුඩා දරුවන් පවා එවැනි රෝගවලට ගොදුරුවන්නට පටන්ගෙන ඇති බව පෙන්වා දෙයි. "මගේ ළාබාලම රෝගියා මාස දෙකහමාරක පිරිමි ළළමයෙකි. ආශ්වාස කිරීමේ අධික අපහසුතාව නිසා ඔහු ආරෝග්‍යශාලාවේ නතර කර ගැනීමට සිදුවිය. අවුරුදු 20 කට පෙර වයස අවුරුද්දකට අඩු ළමුන්ට ස්වාසනාලයේ ඇදුම රෝගය තිබුන බවට කවදාවත් අපි දැන නොසිටියෙමු." යි ඔහු ප්‍රකාශ කළේය.

ඉන්දියාවේ බැංගලෝර් ආරෝග්‍යශාලවේ දී සහ ලේක්සයිඩ් වෛද්‍ය මධ්‍යස්ථානයේ දී රෝගීන් 9000 කට ප්‍රතිකාර කර ඇති අතර බාහිර රෝගීන් වශයෙන් ප්‍රතිකාර කළ ඔවුන්ගෙන් අඩක් පමණ ඇදුම සහ වෙනත් ස්වසන රෝගවලින් පෙළෙන්නෝ වූහ. දිල්ලි නගරයේ පාසල් ළමුන් 20,000 ක් පරීක්ෂා කිරීමෙන් පසු ළමුන් අටදෙනෙකුගෙන් එක් අයෙක් ඇදුම රෝගයෙන් පෙළෙන බවට සොයාගෙන ඇතත් චීනයේ නගරබද ළමයින්ට හුස්ම ගැනීම සාමාන්‍යයෙන් සිගරට් පැකට් දෙකක් උරාබීමට සමානවේ. වාතය අපිරිසිදු වීමෙන් ඇතිවන කරදර ශ්වසන රෝග පමණක් නොවේ. ඉන්දුනීසියාවේ පාසල් ළමුන් 62 ක් පරීක්ෂා කිරීමේ දී ඉන් අඩකට ආසන්න පිරිසකගේ ලේවල භයානක ලෙස ඊයම් අන්තර්ගතව තිබූ බවට සොයාගෙන තිබේ. එය වාහනවලින් ඇතිවන වාතය අපිරිසිදුවීම නිසා සිදුවූවකි.

ඉපදීමට පෙරද තර්ජන ඇතිවේ. ගැබිනි මවක් නව ගර්භනී කාලයේ පළවෙනි තුන්මාසය තුළ සල්ෆර්ඩයොක්සයිඩ් සහිත වාතය ආශ්වාස කළහොත් ඉපදෙන දරුවා අඩු උපත් බර සහිත දරුවකුවන බව තායිවානයේ කෝසියුං හිදී කළ අධ්‍යයනයකින් සොයාගෙන ඇත. පිලිපීනයේ අලුතෙන් උපදින දරුවන්ගේ ලේවල ඊයම් රසදිය, තඹ සහ ටින් බහුලව අන්තර්ගතවී ඇති බව පෙනේ. එමෙන්ම අලුතෙන් උපදින දරුවන්ගේ පෙකනිවැල තුළ මාරාන්තික විෂ අංශු ඇති බව ශෛල්‍යවෛද්‍යවරුන් සොයාගෙන ඇත.

නිවෙස්වලට පිටින් සහ ඇතුළ නිත්ද වාතය අපිරිසිදුවේ. එයින් අවදානමට ලක්වන්නෝ වයස අවුරුදු 5 ත් පහළ දරුවෝය. ආසියාවේ ළමුන් දශලක්ෂයකට වැඩි ප්‍රමාණයක් ඔවුන්ගේ 5 වෙනි උපන්දිනය සැමරීමට ජීවත් නොවෙනු ඇතැයි බොස්ටන්හි හෙල්ෆ් ඉෆෙක්ට් ආයතනය වාර්තා කරයි. දූෂිත වාතය ආශ්‍රිත රෝගවලින් ඔවුන් මියයන බැවිනි.

වැඩිහිටියන්ගේ මෙන් නොව ළමුන්ගේ ශ්වාස නාළය කොට නිසා පරිසරයේ ඇති විෂබීජ පහසුවෙන් පෙනහළු තුළට ඇතුල්වීම එයට හේතුව බව බිජිං නුවර සීකිං යුනිවර්සිටි ස්කූල් ඔෆ් පබ්ලික් හෙල්ත් ආයතනයේ මහාචාර්ය ක්සියාඕවුආන් පැන් ප්‍රකාශ කරයි.



අපිරිසිදු වාතයට මුහුණ දීමේදී වැඩිහිටියන් සහ ළමුන් අතර විවිධ වෙනස්කම් ඇතිවන බව අර්වින් කැලිෆෝනියා විශ්වවිද්‍යාලයේ විෂ වායු විශේෂඥ මයිකල් ට් ක්ලින්මන් පෙන්වා දෙයි. උදහරණයක් වශයෙන් ළමයින් සහ වැඩිහිටියන් කරන සමාන ව්‍යායාමවලදී ළමයින් වැඩි වශයෙන් වාතය ආශ්වාස කරති. පාපන්දු ක්‍රීඩාවේ හෝ එවැනි වෙනත් ක්‍රීඩාවක හෝ නිරතවනවිට ළමයෙක් සියයට 20 ක් සිට 50 ක් දක්වා වැඩි ප්‍රමාණයක් වාතය ආශ්වාස කරන හෙයින් අපිරිසිදු වාතයද වැඩියෙන් ආශ්වාස කරයි. එහෙත් සමාන ක්‍රීඩාවක යෙදෙන වැඩිහිටියන් එපමණ ප්‍රමාණයක් වාතය ආශ්වාස කරනු නොලැබේ.

"නාසය වාතය පෙරන යන්ත්‍රයකි." යනුවෙන් හොංකොංහි ළමා රෝග විශේෂඥයකු වන විල්සන්ෂුංග් කියයි. ළමුන්ගේ නාස වැඩිහිටියන්ගේ නාසවලට වඩා කුඩා හෙයින් ඉදිමීමෙන් හා ස්‍රාවය නිසා ඉක්මනින් අවහිර වේ. එවැනි අවස්ථාවල බොහෝවිට කටින් හුස්ම ගැනීමට සිදුවේ. කට වාතය පෙරනයක් නොවන නිසා මහත් හානි සිදුකරමින් විෂ අංශු අඩංගු වාතය කෙළින්ම පෙනහලු තුළට එක්වේ.

> "නාසය වාතය පෙරන යන්ත්‍රයකි." යනුවෙන් හොංකොංහි ළමා රෝග විශේෂඥයකු වන විල්සන්ෂුංග් කියයි. ළමුන්ගේ නාස වැඩිහිටියන්ගේ නාසවලට වඩා කුඩා හෙයින් ඉදිමීමෙන් හා ස්‍රාවය නිසා ඉක්මනින් අවහිර වේ. එවිට කටින් හුස්ම ගැනීමට සිදුවේ. කට වාතය පෙරනයක් නොවන නිසා මහත් හානි සිදුකරමින් විෂ අංශු අඩංගු වාතය කෙළින්ම පෙනහලු තුළට එක්වේ.

අපේ කලාපයේ මෙකල සිදුවන අතිවිශාල වර්ධනය එළිමහන් වාතය අපිරිසිදුවීමේ මූලික හේතුව වී තිබේ. පසුගිය විසි අවුරුදු කාලය තුළ ඉන්දියාවේ දළ දේශීය නිෂ්පාදනය තුන්ගුණයකට වැඩියෙන් වර්ධනය වී ඇත. තායිලන්තයේ හතර ගුණයකින් හා හොංකොං හි පස් ගුණයක්ද වේ. දකුණු කොරියාවේ හත් ගුණයකින් යුත් වර්ධනය පුදුම සහගතය. චීනය ඊට ආසන්නව පසුපසින් සිටී. එම රටවල කාර්මික නිෂ්පාදන වේගය විස්මයජනක ලෙස වැඩිවී ඇත. 1984 දී දළ දේශීය නිෂ්පාදනය පවුම් බිලියන 256 ක් වූ අතර 2004 දී පවුම් බිලියන 1.65 ක් දක්වා වර්ධනය වී තිබේ. එනම් හය ගුණයකින් වැඩිවීමකි. චීනයේ දැනට කාර් දශලක්ෂ 20 ක් ධාවනය වෙති. 2020 වනවිට දශලක්ෂ 140 ක් දක්වා වැඩිවනු ඇතැයි විශ්වාස කෙරේ. ලෝකයේ භයානක ලෙස වාතය අපිරිසිදු වන නගර 20 න් හතක්ම චීනයේ ඇති බවට ලෝක සෞඛ්‍ය සංවිධානය සොයාගෙන තිබේ.

චීනයේ ජ්ලේ ගඟ මෝය අද්දර වැලිතලාව ශීඝ්‍රයෙන්ම වර්ධනය වන කොටසයි. ලෝකයේ වේගවත්ම ආර්ථික වර්ධනයක් ඇති වේගයෙන්ම දියුණුවන ප්‍රදේශය එයයි. මෙය ගෝලීය වැඩපොළකි. ලෝකයට අවශ්‍ය භාණ්ඩවලින් පහෙන් එකක් එහි නිපදවනු ලැබේ. දිනපතා කර්මාන්තශාලා වලින් විෂබීජ පිටකරනු ලැබේ. එහි වාතය වියළි ගෙන්දගම් ගඳක් දනවයි. එමෙන්ම මීටර් 200 ක් ඔබ්බෙන් පිහිටි ගොඩනැගිලි නොපෙනෙන සුළුය.

ඔක්තෝබර් සිට අප්‍රේල් කාලය සාමාන්‍යයෙන් සුළං සහිත කාලයකි. උතුරේ සිට සුළං හමනවිට අපිරිසිදු වාතය දකුණට හමා යයි. කිලෝමීටර් 30 ක් ඈතින් පිහිටි හොංකොං ප්‍රදේශයට හමන සුළඟ එහිදී වාහනවලින් පිටවෙන විෂබීජ වායුවට බද්ධවේ. සුළඟ හමන දිසාව කුමක්වුවත් ජනෙල්, මාර්ග, රථවාහන සහ ළමුන්ගේ පෙනහලුවල දුඹුරු පැහැති ආලේපයක් ගැල්වේ. හොංකොං විශ්වවිද්‍යාලයේ මහජන සෞඛ්‍ය ප්‍රධානී දොස්තර ඇන්තනි හෙඩ්ලේ ඔහුගේ කාර්යාලයේ සිට ලෝකයේ වැඩිම කාර්ය බහුල ජලමාර්ග වන ලැම්මා ඇළ



දෙස පරීක්ෂාවෙන් බලයි. "මීට අවුරුදු 18 ට පෙර මම මෙහි පැමිණියෙමි. එවිට සිතිජය දක්වා කිලෝමීටර්35 ක් දුර දැකිය හැකිවිය. දැන් ගඟ දිගේ ඇති ගොඩනැගිලි අපැහැදිලි අළු පැහැයක් ගෙන ඇත. එහි බැබළෙන විදුලි එළි පමණක් පෙනේ."

"හොංකොං වාතයෙන් තම දරුවන් ආරක්ෂා වේදැයි අසමින් දෙමව්පියෝ බොහෝවිට දුරකථනයෙන් මට කථා කරති යි හෙඩ්ලේ කියයි. එහි සිටින ළමුන් සියලු දෙනාම අපිරිසිදු වාතය නිසා දිනපතාම රෝගාතුර වී ඇති බව කීමට සිදුවේ. පර්ල් ගංගා වැලිතලාවේ පිහිටි කර්මාන්තශාලා වැඩි ගණනක හිමිකරුවෝ හොංකොං ව්‍යාපාරිකයින් බව ඔහු කියයි. ළමයින්ගේ සෞඛ්‍යයට සිදුවන හානි සම්බන්ධව කෙළින්ම එම ව්‍යාපාරිකයින් වග කිවයුතුයි."

අවුරුදු 6 ක් වියැති "සිසිලියා හෝ" ටොරොන්ටෝ හි උපන් දැරියකි. හොංකොං වෙත පැමිණෙන තෙක් අසාධ්‍ය තත්ත්වයේ ශ්වසන රෝග ඇයට වැළඳී නොතිබුනි. මාස දෙකකට පසු ඇය කහින්නටත් හති දැමීමටත් පටන්ගත් බව ඇගේ මව ලෙනී හෝ කියන්නීය. ඇය ඇදුම රෝගයෙන් පෙළෙන්නියක් බව ළමා රෝග පිළිබඳ විශේෂඥ විල්සන් ෆැන්ග් මාස ගණනකට පසු කීවේය. නගරයේ පවතින විෂ සහිත වායුව එයට ආසන්නම හේතුව බව ඔහුගේ විශ්වාසයයි. දැන් සිසිලියා හැකිතාක්දුරට නිවස තුළම රැඳවා සිටින්නීය. "ගෙදර

එක් අවුරුදු හැරින්
කඳුළු සහිත ඇස් සහ
සොටුදියර ගලන
නැහැයක් ඇත්තියකි.
තුන් හැවිරිදි ආශා
වේගයෙන් කහින්නියකි.
ඇගේ කැස්සට අසල
තිබෙන තල් ගසේ අතු
සට සට ගා සොලවයි.
හෙප්සිබා අවුරුදු 4 ක
ළමයෙකි. නාසය හිරවීම
නිසා රතු පැහැ ගැන්වී
ඇත. නාගමාලී හුස්ම
ගැනීමේ දී මහන්සි
ගතියක් පෙන්වයි.
ඇය දින හතරකට
පෙර උපන් දැරියකි.

ජනෙල් විවෘතව තැබිය නොහැකි නිසා වායුසමීකරණ යන්ත්‍ර පණගන්වා තැබීමට අපට සිදුවී තිබේ" යයි ඇගේ මව පවසයි.


"මුළුතැන්ගෙයි මාරයා - දුම - නමැති මාතෘකාව සහිත ඉන්ටර්මීඩියට් ටෙක්නොලොජි ඩිවෙලොප්මන්ට් ග්‍රූප් නම් එක්සත් රාජධානියේ ස්ථාපිත පුන්‍ය ආයතනයක වාර්තාවක් ගණනය කර ඇති අන්දමට නිවෙස් තුළ සිදුවන වාතය අපිරිසිදු කිරීම් හේතුකොට ආසියාතු ළමුන් දශලක්ෂ බාගයක් පමණ වාර්ෂිකව මරණයට පත්වන බව දක්වේ. වැඩිවශයෙන් බලපෑම් ඇතිවන්නේ ඉන්දියාවේ සහ චීනයේ ළමුන්ට බවත් එමඟින් පෙන්වා දී ඇත.

දකුණු ඉන්දියාවේ තිරුපලේයවනම් 1500 ක් පමණ ජන ගහණයෙන් යුත් ගමකි. ධීවර සහ ගොවි ජනතාව එහි වාසය කරති. විෂ අඩංගු සියුම් අංශු අහසට මුදහරින කර්මාන්ත එහි නොමැත. එමෙන්ම ඉන්ධන දහනයෙන් පරිසරයට මුදහරින රසායනික ද්‍රව්‍ය අඩංගු දුම් පිටකරන බර වාහන ධාවනයද නොවේ. එනෙකුදු වුවත් තිරුපලේයිවනම් හි ජීවත්වන ළමුන් වායු විෂවීමේ මාරක උවදුරට ලක්විය හැකිය.

"විනෝදනී සය අවුරුදු දැරියකි. ඇය කැස්සකින් පෙළෙන්නීය. කහිනවිට කට කට ගා ශබ්ද නසයි. ඇය කුඩාකල වැළදෙන ඇදුම රෝගයෙන් පෙළෙන්නික්විය හැකිය. ඇයට ප්‍රතිකර්ම නොකළහොත් හෝ අයෝග්‍ය ප්‍රතිකර්ම කළහොත් හෝ යථා තත්ත්වයට පත්කළ නොහැකි වනසේ පෙනහලු හානිවන්ට ඉඩ තිබේ. යයි චෙන්නෙයි හි ශ්වසන රෝග පිළිබඳවෛද්‍ය රාජ් බී සිං පෙන්වා දෙයි.

එක් අවුරුදු හැරින් කඳුළු සහිත ඇස් සහ සොටුදියර ගලන නැහැයක් ඇත්තියකි. තුන් හැවිරිදි ආශා වේගයෙන් කහින්නියකි. ඇගේ කැස්සට අසල තිබෙන තල් ගසේ අතු සට සට ගා සොලවයි. හෙප්සිබා අවුරුදු 4 ක ළමයෙකි. නාසය හිරවීම නිසා රතු පැහැ ගැන්වී ඇත. නාගමාලී හුස්ම ගැනීමේ දී මහන්සි ගතියක් පෙන්වයි. ඇය දින හතරකට පෙර උපන් දැරියකි.

මම ඔබට වරදකරු පෙන්වන්නම් කිවු දෙස්තර සිං මැටිටෙන් සහ ගඩොලින් බැඳි පොල්අතු සෙවිලිකළ වහල සහිත ගෙයක් දෙසට යන්නේ ය. එහි එක කාමරයක් තිබේ. විශාලත්වය හතරැස් මීටර් හයක් පමණ වේ. පැත්තක ඇදක් සහ අනෙක් පැත්තේ ආහාර පිසින උඳුනක් විය. උඳුන පැත්තක අතු සහ රිකිලි ගොඩගසා තිබේ. සමහරවිට ඔවුන් ගොම පුළුස්සන බවද, සිං කියයි. ගොම, දර, අඟුරු සහ ධාන්‍ය ඉතිරි කොටස් ආදි වියළි ද්‍රව්‍ය දර වශයෙන් භාවිත කරන විට උදුනේ දුම් පිට නොකිරීම හෝ අඩු වශයෙන් පිට කිරීම හෝ නිසා විෂබීජ සහිත වාතය නිපදවේ. එයින් ළමුන්ගේ පෙනහලු හානි වේ. පිටේ ගෙනයන පෙර පාසල් ළමුන් බොහෝවිට වැඩියෙන් ආබාධවලට ලක්විය හැක. අමතර වියදමක් දරා පිරිසිදු කළ ඉන්ධන පාවිච්චිකර ළමුන් ආරක්ෂා කරගැනීමට කැමති



දැයි තිදරු මවකගෙන් ඇසුවිට ඇය හිස ගසා දැම්මා යයි දෙස්තර සිං කියා සිටියි.

රෝග වළක්වා ගැනීමේ ප්‍රතිපත්තියක් නොමැති බව සිං පසුව ප්‍රකාශ කරයි. ඇගේ දරුවන් සියලු දෙනාම ස්වසන රෝග ලක්‍ෂණ ඇත්තවුන් වේ. එසේ වීමට හේතුව ආහාර පිසීමට දර භාවිතා කිරීම බව ඇය පිළිගනියි. එහෙත් තත්ත්වය බරපතල වී වහා වෛද්‍ය ප්‍රතිකාර ගැනීමට සිදුවන තෙක් කිසිවක් කිරීමට ඇය කැමති නොවේ.

දුම්කවුළු සහිත උදුන් හඳුන්වා දී නිවෙස් තුළ සිදුවන වාතය අපිරිසිදුවීම් අවම කිරීමේ සැලසුම් ගණනාවක් ඇති කිරීමට රජයේ සහ පෞද්ගලික අංශයේ සූදානමක් ඇත. එහෙත් තාක්ෂණික භාවිතය පමණක් එයට ඇති පිළියම නොවන බව ඉන්වෙස්මන්ට් ටෙක්නොලොජි ඩිවෙලොප්මන්ට් සංවිධානය වාර්තාවලින් පෙන්වා දෙයි. ආහාර පිසීම ගෙදර කටයුත්තක් මෙන්ම සංස්කෘතිකමය කටයුත්තකි. එහෙයින් සමාජය මෙන්ම ස්ත්‍රීන්ද මේ සඳහා සහභාගි විය යුතුය. ඔවුන්ගේ අවශ්‍යතාවන්ට සරිලන පරිදි විසඳුම් දියුණුකර ගැනීමට ස්ත්‍රීන් ශීඝ්‍රව කටයුතු කළ යුතුවේ.

කර්මාන්තශාලාවලින් සහ වාහනවලින් පරිසරයට සිදුවන හානි නැවැත්වීමට අදාළ නීති ක්‍රියාත්මක කිරීමට ජාතික රාජ්‍යයක් පියවර ගත යුතුව තිබේ. නොඑසේනම් ළමුන් මරණයට ගොදුරුවීම සිදුවනු ඇතැයි මහජන සෞඛ්‍ය නිලධාරීහු ඒකමතිකව පවසති. මේ සඳහා ස්ථිර දේශපාලන සම්මුතියක් ඇතිවිය යුතුයයි හෙඩ්ලේ කියා සිටී. 1990 දී හොංකොං රජය කළ ආකාරයට ක්‍රියා කිරීමෙන් වායු දූෂණ නීති පැනවීමෙන් ළමුන්ගේ සෞඛ්‍ය තත්ත්වයන්

**ලෝක සෞඛ්‍ය සංවිධානයේ සහ එක්සත් ජනපදයේ පරිසරය සුරැකීමේ සංවිධානයට සමගාමී වන ප්‍රමිති තත්ත්වයන් සිංගප්පූරුවේ ස්ථාපිත කර ඇත. එරට නව කර්මාන්තයක් ආරම්භ කිරීමට පෙර එහි සැලසුම් පාරිසරික නීතිවලට අනුකූලව තිබේදැයි පරීක්‍ෂා කරනු ලැබේ. වාහන සඳහා ද දැඩි නීති පනවා තිබේ.**

වහා දියුණු කළ හැකිය. නීති ක්‍රියාත්මක කිරීමෙන් මාස ගණනකට පසු පාසල් ළමුන්ගේ පෙනහලු ක්‍රියාකාරිත්වය සැලකිය යුතු අන්දමින් වර්ධනය වී ඇත. එහෙත් ප්‍රධාන වශයෙන් චීන මහා භූමියේ ඇතිවූ වායු දූෂණය හේතුකොට ඇතිවූ දියුණුව සම්පූර්ණයෙන් යටපත් විය.

ලෝක සෞඛ්‍ය සංවිධානයේ සහ එක්සත් ජනපදයේ පරිසරය සුරැකීමේ සංවිධානයට සමගාමී වන ප්‍රමිති තත්ත්වයන් සිංගප්පූරුවේ ස්ථාපිත කර ඇත. සිංගප්පූරුවේ නව කර්මාන්තයක් ආරම්භ කිරීමට පෙර එහි සැලසුම් පාරිසරික නීතිවලට අනුකූලව තිබේදැයි පරීක්‍ෂා කරනු ලැබේ. එම කටයුතු සොයා බැලීමට පරීක්‍ෂණද සිදුවේ.වාහන සඳහා දැඩි නීති පනවා තිබේ. ඒ සමගම වාහනයක් අයිති කරගැනීමට ඇති වරප්‍රසාද වෙන්දේසි කිරීමෙන් මාර්ගයේ වාහන ධාවනය සීමාකර ඇත.

නමුත් කලාපයේ අනෙක් රටවල පවතින තත්ත්වයන් සුබවාදී නොවන බව හෙඩ්ලේගේ මතයයි. අපි අඳුරු යුගයකට මුහුණපා සිටිමු.

දැඩි නීති ක්‍රියාත්මක නොකරන්නේනම් දියුණුවන ආසියාවේ ළමයෙක් ඔහු හෝ ඇය මෝ විසිපස්වන වියට පාතබන විට වයසෙන් අවුරුදු හයක් හෝ දහයක් අභිමුව සිටිනු ඇත. වායු සමීකරණය කළ ස්ථානවල ජීවත්වන අය එසේ නොවනු ඇත. යනුවෙන් හෙඩ්ලේ ප්‍රකාශ කරයි.

පාරිසාරික උපද්‍රව හේතුවෙන් අවුරුදු පහෙන් පහළ ළමුන්ගේ මරණ සංඛ්‍යාව තුනෙන් දෙකක් අඩුකරන ලෙස ලෝක සෞඛ්‍ය සංවිධානය රටවල්වලට දන්වා ඇත. පරිසරය ආශ්‍රිත කරදරවලින් වැඩි වශයෙන් පෙළෙන්නෝ ළමුන් බව පවසන ලෝක සෞඛ්‍යය සංවිධානයේ අධ්‍යක්‍ෂ දොස්තර ලී ජෝං වුක් එවැනි රෝගවලින් වළකා ගැනීමට අසමත් වීමේ වන්දිය ගෙවීමට ළමුන්ට සිදුවී තිබීම කිසිසේත් පිළිගත නොහැකි බව ද කියයි.

රීඩර්ස් ඩයිජස්ට් ඇසුරිනි

❑

**ඩබ්ලිව්. වී සී. දිසානායක**